**මන්මුනෙයි දකුණ එරුවිල් පත්තු ප්‍රාදේශීය සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූනි 19 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මන්මුනෙයි දකුණ එරුවිල් පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | නිර්දේශ | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වීම. | ඉදිරි කාලවලදී රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව පිළියෙල කිරීම සඳහා උපදෙස් ලබා ගනිමින් පවති. |

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ වෙළඳපොල බදු දීම් සම්බන්ධයෙන් බදුකරුවන් දෙදෙනෙකුගෙන් 2018 කාලපරිච්ඡේදයේ අයකළ රු. 281,063 ක් ආදායමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | නියමිත පරිදි ආදායම් ගිණුම්ගත යුතුවේ. | 2018 වර්ෂයේදී සභාවේ වෙළඳපොල බදුකරුවන්ගෙන් ලැබු කොටස් රු.281,063 ක් සභාවේ ආදායමට මාරු කිරීමට කටයුතු කර ඇත. |

### 1.3.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු. 219,327,731 ක් වූ ගිණුම් විෂයන් 06 කට අදාලව ඉඩම් ඔප්පු, වත්කම් ලේඛන හා අයිතිය තහවුරු කිරීමේ ලියවිලි ආදිය ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂ තහවුරු කිරීමේ සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, මෝටර් රථ වැනි ස්ථාවර වත්කම් කිහිපයක් සඳහා සාක්ෂි ලැබී ඇති අතර අනෙකුත් ඒවා සඳහා වන ලේඛන ලබාගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. තවද, විදුලිය බෙදාහැරීම සහ වියදම් ණයහිමියන් පිළිබඳ තොරතුරු ලබා ගත නොහැකි විය. |

### 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නිතී, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව

නිතී, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නිතී රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය | සභාවේ සේවය කරන කාර්ය මණ්ඩලය සඳහා මානව සම්පත් සැලැස්මක් සකස් කර නොතිබුණි. | සේවය කරන කාර්ය මණ්ඩලය සඳහා මානව සම්පත් සැලැස්මක් සකස් කර තිබිය යුතුවේ. | සභාවේ සේවය කරන කාර්ය මණ්ඩලය සඳහා මානව සම්පත් සැලැස්මක්, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංශයේ සේවය කරන සේවකයන් සඳහා වෙනම මානව සම්පත් සැලැස්මක්, සකස් කර ඇත. එසේම, අනෙකුත් කාර්ය මණ්ඩලය පිළිබඳ මානව සම්පත් සැලැස්ම සම්බන්ධයෙන් කළමනාකරණ පුහුණු දෙපාර්තමේන්තුව විසින් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 1.4.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ලැබිය යුතු ගිණුම්** | | |
| මූල්‍ය ප්‍රකාශනවල හිඟ හිටව පවතින විදුලි ණය රු.1,656,338 ක් අඛණ්ඩව වර්ෂ 10 කට අධික කාලයක් ගිණුම්වල ඉදිරිපත් කරමින් තිබුණත්, ඒ පිළිබඳ | හිඟ මුදල් අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට ක්‍රියාකළ යුතුවේ. | සැපයූ විදුලි ගාස්තු පිළිබඳ විස්තර, විදුලි බල මණ්ඩලයට ලබා දී තිබූ අත්තිකාරම් පිළිබඳ පොත්පත්වල විස්තර නොමැති වීමෙන් ඒවා අයකිරීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට කටයුතු |

| | | |
|---|---|---|
| ලියකියවිලි, ලේඛන සහ තහවුරු කිරිමේ සාක්ෂි කිසිවක් නොමැතිව ගිණුම්වල ඉදිරිපත් කරමින් පැවැති අතර හිඟයන් අයකර ගැනීමට හෝ පොත්වලින් කපාහැරීමට කටයුතු කර නොතිබුණි. | | කිරීමට හෝ නොහැකි වී තිබුණි. |
| **(ආ) ගෙවිය යුතු ගිණුම්** | | |
| (i)මූල්‍ය ප්‍රකාශනවල ණයහිමියන් ලෙස දක්වා ඇති රු. 406,537 ක් සහ බෙදාහැරීමේ ණය රු.2,069,410 ක් වර්ෂ 05 කට අධික කාලයක සිට හඳුනාගෙන නිරවුල් කිරීමට හෝ ඒවා කපාහැරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරිමට හෝ කපාහැරීමට කටයුතු කළ යුතුවේ. | මූල්‍ය ප්‍රකාශනවල ණය හිමියන් ලෙස දක්වා ඇති ණය ලබා දුන්නන් රු.406,537 ක් සහ විදුලිය බෙදාහැරීමේ ණය රු.2,069,410 ක් වර්ෂ 05 කට අධික කාලයක සිට හඳුනාගෙන ඒවා නිරවුල් කිරීමට හෝ කපා හැරිමට කටයුතු කර නොතිබුණි |
| (ii) තැන්පත් ගිණුමේ වර්ෂ 04 කට වැඩි කොන්ත්‍රාත්කරුවන් 16 දෙනෙකුට ලබාදිය යුතු ඇප මුදල් රු.172,529 ක් ගෙවා නිරවුල් කිරීමට හෝ ආදායමට මාරු කිරිමට කටයුතු කර නොතිබුණි. | ඇප මුදල් නිරවුල් කිරීමට හෝ ආදායමට මාරු කිරීමට කටයුතු කළ යුතුවේ. | සභාවේ තැන්පත් ගිණුමේ වර්ෂ 04 ක කාලයක සිට පැවත එන කොන්ත්‍රාත්කරුවන්ගේ ඇප මුදල් ආපසු ගෙවීමට හෝ ආදායමට මාරු කිරීමට කටයුතු කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 38,793,420 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 20,586,408 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලොචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස් කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස් කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 18,000 | 2,024,650 | 1,888,890 | 396,609 | 1,200,000 | 1,828,310 | 1,828,310 | - |
| කුලී | 18,244,200 | 22,170,000 | 21,632,495 | 4,342,056 | 15,174,400 | 18,556,129 | 14,753,576 | 3,802,553 |
| බලපත්‍ර ගාස්තු | 2,200,000 | 2,374,450 | 2,374,450 | - | 1,250,000 | 2,412,093 | 1,617,020 | 795,073 |
| අනෙකුත් ආදායම් | 21,535,000 | 46,573,750 | 40,786,143 | 25,905,721 | 62,955,640 | 45,988,563 | 36,178,461 | 9,810,102 |
| එකතුව | **41,997,200** | **73,142,850** | **66,681,978** | **30,644,386** | **80,580,040** | **68,785,095** | **54,377,367** | **14,407,728** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දීර්ඝ කාලයක සිට පැවත එන හිඟ කුලී රු. 3,802,553 ක් අයකිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගෙන් කපා හැරීම සම්බන්ධයෙන් උපදෙස් ලබාගෙන කමිටුවක් පත්කර තීරණයක් ගෙන කටයුතු කරනු ලැබේ. |

### 2.2.3 අනෙකුත් ආදායම්

**උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු**

**මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 ඔක්තෝබර් සිට දෙසැම්බර් 31 දින හා 2019 ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදයට අදාළ මුද්දර ගාස්තු ප්‍රාදේශීය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් නියමිත කාල පරාසයන් ඇතුළත අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පසුගිය සහ සමාලෝචිත වර්ෂය දක්වා ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ කාර්තු 03 කට අදාළ විස්තර ඒකාබද්ධ කර ඉදිරිපත් කර තිබුණි. 4 වැනි කාර්තුවට අදාළ විස්තර 2020 හිදී ලැබී ඇත. මෙවැනි කාල ප්‍රමාදයන් නිසා කඩිනමින් ලබාගත නොහැකි වී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **තිරසාර සංවර්ධන ඉලක්ක** | | |
| 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වේ. | එසේ මේ සඳහා මෙහෙයුම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරමින් පවතී. |

### 3.2 වත්කම් කළමනාකරණය

#### 3.2.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| චංචල හා නිශ්චල දේපල ස්ථාවර වත්කම් ලේඛනයේ ලේඛනගත කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයේ ලේඛනගත කිරීම සඳහා කටයුතු කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකමින් ආසන්න වශයෙන් 60% ක් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම හේතුවෙන් ඇති වූ මූලධන වියදම් වේ. ඉතිරි ඒවා ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම වේ. එබැවින්, ඒවා ස්ථාවර වත්කම් ලේඛනයේ ලේඛනගත කිරීමට කටයුතු යොදා ඇත. |

#### 3.2.2 නඩත්තු හා අලුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවට අයත් බැකෝ රෝලරයක්, ගලි බවුසරයක්, ට්‍රැක්ටරයක්, කුඩා ප්‍රමාණයේ ට්‍රැක්ටරයක්, සහ Motor Grander යන්ත්‍රයක් ආදිය වර්ෂ 03 කට අධික කාලයක සිට නිශ්ක්‍රීයව පැවතුණි. මේවා අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසි මඟින් විකිණීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සිදුකර නොතිබුණි. | අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | සභාවේ පවතින වත්කම්වලින් අලුත්වැඩියා කළ නොහැකි වාහන සඳහා නැගෙනහිර පළාත් යාන්ත්‍රික ඉංජිනේරුවරයාට ඒවා පරීක්ෂා කර වාර්තාවක් ලබාදෙන ලෙස ඉල්ලීම් කර ලිපි යවා ඇත.ඒ අනුව යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ වාර්තාව ලැබූ වහාම කටයුතු කරනු ලැබේ. |

## 3.3 ප්‍රසම්පාදනය

**ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සැපයුම් හා සේවා සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කල යුතු වේ. | ඉදිරියට එළැඹෙන වර්ෂවලදී ඉහත සඳහන් කරුණු සමග ප්‍රාදේශීය සභා වර්ෂ 4 සංවර්ධන සැලැස්මේ යෝජනාද සැලකිල්ලට ගෙන මෙය මනාව සකස් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන කාර්යයන් සිදුකළ යුතු වේ. | වර්තමානයේ අභ්‍යන්තර විගණනය භාරව ප්‍රධාන කළමනාකාර සහකාර නිලධාරිවරයා පත්කර අභ්‍යන්තර විගණන වාර්තාව ඉදිරිපත් කර ඇත. |

## 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පැවැත්විය යුතු වේ. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා සැලසුම් කර ඇත. |